# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/10 - 2019 ජුනි මස 03 වැනි සඳුදා - 2019.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XV)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවමින් සාදන ලද, (2018 දෙසැම්බර් මස 05 වැනි දින අංක 2100/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1996 මාර්තු මස 27 වැනි දින අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනය එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''කළමනාකරණ සහ වාණිජ පීඨය'' යන අයිතමයට අනුරූපව එකී උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''(ඇ) කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(ඈ) අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය''.

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

06 - 519


1A - PG 4542 — 518 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*